# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/27 - 2019 මැයි මස 08 වැනි බදාදා - 2019.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය මාර්ගයේ අංක 210/3 පාලම සඳහා ඉඩම් අත්කර ගැනීම

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ රන්න ගමේ රන්න බටහිර ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 328 හා 2016.09.30 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 732, 733 කැබලි 2ක් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0058 ක් වන කැටන්ලහකොරටුව, පල්ලමේඅත්මඟ, පල්ලම සහ අඹගහවෙල නමැති ඉඩම්වලට මායිම්.

01. **කැබලි අංක 732 - ඉඩමේ නම: කැටන්ලහකොරටුව, සහ පල්ලමේඅත්මඟ, පල්ලම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0052;**

උතුරට: කැබලි අංක 79; නැගෙනහිරට: කැබලි අංක 79; දකුණට: කැබලි අංක 79; බටහිරට: කැබලි අංක 79, 81ඒ සහ 733.

02. **කැබලි අංක 733 - ඉඩමේ නම: අඹගහවෙල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006;**

උතුරට: කැබලි අංක 81ඒ; නැගෙනහිරට: කැබලි අංක 79 සහ 732; දකුණට: කැබලි අංක 81ඒ; බටහිරට: කැබලි අංක 81ඒ.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2019 ජූලි මස 10 වැනි දින පෙ.ව. 10.00ට තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 ජූලි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
තංගල්ල.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තංගල්ල.

05 - 555

1A - G 30023- 17 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.